# තක්කාලි

## *සොලනම් ලයිකොපර්සිකම් - Solanum lycopersicum*

## කුලය - සොලනේසී

ලංකාවේ උඩරට තෙත් කලාපයේ හැර අනිකුත් සියලුම කෘෂි දේශගුණික කලාපවල තක්කාලි වගා කළ හැකිය. එය ගොවියාට සාර්ථක ආදායමක් උපයාදෙන, සැලකියයුතු අපනයන විභවයක් ඇති හා විටමින් ඒ, සී හා ඛනිජ පදාර්ථ අඩංගු බෝගයක් ද වේ.

### නිර්දේශිත ප්‍රභේද

**කේ.ඩබ්.ආර්.(ටී.62)**

පදුරු තක්කාලි ප්‍රභේදයකි. බැක්ටීරියානු හිටු මැරීමට හොඳින් ඔරොත්තු දේ. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 50 ක් පමණය.

**රෝමා**

පදුරු තක්කාලි ප්‍රභේදයකි. පහත රට වියළි කලාපයට වඩාත් සුදුසුය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 60 ක් පමණවේ. තද පොත්තක් සහිතය: බල්බාකාර හැඩැතිය.

**මාර්ග්ලෝබ්**

වැල් තක්කාලි ප්‍රභේදයකි. වඩාත් සුදුසු වන්නේ උඩරට අතරමැදි කලාපයටය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 100 ක් පමණය: තද පොත්තකින් යුක්තය.

**බියන්ස් (ටී.89)**

අර්ධ වශයෙන් වැල් ආකාරයට වැඩෙන තක්කාලි ප්‍රභේදයකි. උඩරට අතරමැද කලාපයට වඩාත් සුදුසුය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 100 ක් පමණවේ: තද පොත්තක් සහිතය

**ටී. 146**

පදුරු තක්කාලි ප්‍රභේදයකි. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 90 ක් පමණය. තද පොත්තක් ඇත. බැක්ටීරියානු හිටුමැරීමේ රෝගයට, නෙමටෝඩාවන්ට ප්‍රතිරෝධිය, කොළ කොඩවීමේ වයිරස් රෝගයට ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමක් පෙන්වයි.

**විහාර 2**

F1 දෙමුහුම් ප්‍රභේදයකි. වර්ධන විලාශය පදුරක් වැනිය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 65 පමණ වේ. තද පොත්තක් සහිතය.

**තිළිණ**

අපරිමිත වර්ධනයක් සහිත වැඩි අස්වනු දෙන ප්‍රභේදයකි. දින 45 දී මල් පිපෙන අතර මාස 2 1/2 දී පළමු අස්වැන්න ලබා දේ. අවම වශයෙන් වාර 12 පමණ අස්වනු ලබාගත හැකිය. සලාද සඳහා මෙන්ම විවිධ නිෂ්පාදන සැකසීම සඳහා ද සුදුසු මෙම ප්‍රදේශයේ ගෙඩි තද ස්වභාවයකින් යුක්ත නිසා ප්‍රවාහනයේදී සිදුවන හානි වලට හොඳින් ඔරොත්තු දේ. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 85-95 පමණ වේ. ඉදුණු ගෙඩි තැඹිලි රතු පාටය. ගෙඩියක් තුළ අඩංගු බීජ ප්‍රමාණය වෙනත් බොහෝ වර්ග වලට වඩා අඩුය.

**රවි**

වැඩි පරිසර උෂ්ණත්වයක් පවතින ප්‍රදේශ සඳහා විශේෂයෙන් ගැලපෙන ප්‍රභේදයකි. පරිමිත වර්ධනයක් සහිතයි. ඉදුණු ගෙඩි තැඹිලි-රතු පාටය. පසු අස්වනු හානි අඩුය. ගෙඩි පිපිරීමට හා හිටුමැරීමට තරමක් ඔරොත්තු දේ.

**තරිඳු**

හිටුමැරීමට හොඳින් ඔරොත්තු දෙන තද රතු පැහැති මදයක් සහිත රවුම් ගෙඩි හටගන්නා වර්ගයකි. විවිධ තක්කාලි නිෂ්පාදන සැකසීම සඳහා විශේෂයෙන් සුදුසුය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 43 පමණ වේ.

### බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයට - ග්‍රෑම් 300-400

### තවාන් පිළියෙල කිරීම

මීටර් 1 ක් පළල × මීටර් 3 ක් දිග තවාන් පාත්ති 20 ක් හෙක්ටයාරයක් සඳහා අවශ්‍යය.

පාත්ති වටා කාණුව, සෙ.මී. 45 ක් පළලට සකසන්න. තවාන් පාත්ති සෙ.මී. 18-20 පමණ උස්විය යුතුය.

මතුපිට පස් හා කොම්පෝස්ට් සම ප්‍රමාණ වලින් මිශ්‍ර කර, සෙ.මී.5 පමණ ගනකම තට්ටුවක් සේ පාත්තිය මත අතුරන්න.

ජීවානුහරණය

රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් -

කැප්ටාන්/තිරාම් යොදා

පිළිස්සීම මගින් -

පාත්තිය හොඳින් තෙමා මාරුවෙන් මාරුවට දහයියා හා පිදුරු තට්ටු වශයෙන් දමා පුළුස්සා ගන්න.

## බීජ තවාන් දැමීම

**සුදුසු කාලය :**

මාර්තු මැද හෝ අගෝස්තු මස අගදී

**බීජ ප්‍රතිකාර කිරීම :**

බීජ ග්‍රෑම් 125 කට දිලීරනාශක ග්‍රෑම් 2 ක් (උදා: කැප්ටාන්/තිරාම්)

තවානේ පේලි අතර පරතරය:සෙ.මී. 12 -15 ක් වනසේ බීජ තුනීව දමන්න.

**බීජ සිටුවන ගැඹුර :**

සෙ.මී. 0.5 -1.0 කි. තුනී පස් තට්ටුවකින් බීජ වසන්න. ඉන්පසු පාත්තිය පිරිසිදු පිදුරු වැනිද්‍රව්‍යයකින් තුනීව වසන්න. දිනපතා ජලය දමන්න.

අධික වැස්සෙන්/හිරු එළියෙන් ආරක්ෂා කර ගැනීම සඳහා තවාන ආවරණය කරන්න. දින 7කින්, පසු වසුන ඉවත් කරන්න. දින 8 - 10 තුළදී පැල තුනී කරන්න. වල්පැළෑටි අතින් ගලවා දමන්න.

පැල ගැලවීමට දින කිහිපයකට කළින් පැල දැඩිකිරීම සඳහා තවානට ජලය අඩුවෙන් සැපයීම හා වැඩි වේලාවක් හිරුඑළියට පැල නිරාවරණය කිරීම වැදගත්ය.

## ක්ෂේත්‍රය පිළියෙල කිරීම

පෙර කන්නයේ සොලනේසියේ කුලයේ (මිරිස්, බටු, අර්තාපල්) බෝග වගා නොකළ ඉඩමක් වගාව සඳහා තෝරා ගන්න.

ගැඹුරු පස් පෙරළීමකින් පසු පොලොව මට්ටම් කොට මනාව ජලය බැසයන පරිදි ඉඩම සකසා ගන්න.

## පරතරය

සෙ.මී. 80 × 50

## ක්ෂේත්‍රයේ සිටුවීම

පැල ගැලවීමට දිනකට පෙර තවාන් හොඳින් තෙත් කරන්න.

තවානේ පැල දින 14 - 21 අතරදී ගලවා සිටුවන්න. සවස් වරුවේ පැල සිටුවන්න.

පැල සිටුවන සෑම වලකටම කාබනික පොහොර යොදන්න. (ටොන් 6 - 12/හෙක්ටයාරයකට)

සමතලා පාත්ති වල හෝ උස් පාත්ති වල හෝ පැල සිටුවීම කරන්න. පැල සිටුවා අධික හිරුරැස් ඇති නම් පැල වල මුල් වැඩෙන තෙක් ආවරණය කොට තබන්න.

## පොහොර යෙදීම

සකසාගත් වලවල් වලට පැල සිටුවීමට දින 2-3 පෙර කාබනික පොහොර සහ මූලික පොහොර වශයෙන් යෙදිය යුතු රසායනික පොහොර යොදා පස් සමඟ මිශ්‍ර කරන්න. කාබනික පොහොර වශයෙන් හෙක්.ටොන් 10 පමණ කුකුල් පොහොර ද යෙදිය හැකිය.

### රසායනික පොහොර

| | යූරියා හෙ/කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ/කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ්පොටෑෂ් හෙ/කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 65 | 325 | 65 |
| සිටුවා සති 3කට පසු | 65 | - | - |
| සිටුවා සති 6කට පසු | 65 | - | 65 |

- බදුල්ල දිස්ත්‍රික්කය සඳහා ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙක්.කි.ග්‍රෑ. 220 යොදන්න.

## ජල සම්පාදනය

ගස්වලට ප්‍රමාණවත් ලෙස ජලය ලබා දෙන්න. වැඩිපුර ජලය යෙදීම සුදුසු නැත. විශේෂයෙන් වියළි කාලයකට පසු වැඩිපුර ජලය යෙදුවහොත් ගෙඩි පිපිරීමට ඉඩ තිබේ.

## වල් මර්දනය

පැල සිටුවා සති 3 දී හා 6 දී සිදු කරන්න.

## ආධාරක සිටුවීම

ගස් ඇද වැටීම වලකාගැනීම සඳහා මල්පිපීම ආරම්භ වීමට කලින් ගස් අසල සිටුවාගත් කෝටුවලට ගස් තබා ප්‍රවේශමෙන් බඳින්න.

## කෘමි පාලනය

### තක්කාලි ගෙඩි විදින පණුවා

හානියේ ලක්ෂණ

කුඩා පනුවා කෙටි කාලයක් පත්‍ර කමින් ක්‍රමයෙන් ගෙඩි විදීමට පටන් ගනී. ගෙඩිවල සිදුරු දක්නට ලැබේ.

පාලනය

පහත සඳහන් කෘමිනාශක වලින් එකක් වගාවට යොදන්න.

ක්ලෝෆ්ලුවසුරොන් - මි.ලී.10
50 g/1 (ඇටබ්‍රොන්)

බැසිලස් තුරෙන්ජිඑන්සිස් - ග්‍රෑම් 45 (බී.ටී.)

ඉහත කෘමිනාශක වල නියමිත ප්‍රමාණ ජලය ලීටර 10 ක බැගින් දියකර ඉසින්න.

මල් හා ගෙඩි හටගන්නා අවධියේදී කෘමිනාශක ඉසිය යුතුය අවශ්‍ය නම් පමණක් දින 14 කට වරක් කෘමිනාශකද දින 10 කට වරක් බී.ටී ද යෙදීම වඩාත් සුදුසුය. අස්වැන්න නෙලීමට දින 14 කට පෙර කෘමිනාශක යෙදීම නවත්වන්න.

### කියත් පනුවා

හානියේ ලක්ෂණ

කුඩා පැලවල කඳ කපා විනාශ කර දමයි.

පාලනය

කෙෂ්ත්‍රයේ පස හොඳින් පෙරලා හිරුඑළියට නිරාවරණය කරන්න.

සිටුවන අවස්ථාවේ හෙක්ටයාර 1 කට කාබොෆියුරාන් 3% කි.ග්‍රෑ. 22 - 35 අතර ප්‍රමාණයක් පසට කලවම් කරන්න.

එසේ නැතහොත්

පහත සඳහන් කෘමිනාශක වලින් එකක් පැල සිටුවීමෙන් පසු පැලය වටා පස තෙමෙනසේ යොදන්න.

ට්‍රයික්ලෝෆෝන්, 500 g/1 - මි.ලී.37(ඩිප්ටෙරෙක්ස්)

ප්‍රොෆෙනොෆොස්, 500 g/I - මි.ලී. 23 (සෙලික්‍රෝන්)

ප්‍රොතියොෆොස්, 500 g/1 - මි.ලී. 30 (ටොකුතයෝන්)

ක්ලෝෆ්ලුවසුරෝන්, 50 g/1 - මි.ලී. 10 (ඇටබ්‍රෝන්)

ඉහත කෘමිනාශක ප්‍රමාණ ජලය ලීටර් 10 ක බැගින් මිශ්‍රකර යොදන්න.

## රෝග පාලනය

### තවාන් රෝග

දිලීර වර්ග කිහිපයක් නිසා දියමලන්කෑම නොහොත් පාමුල කුණුවීම ඇතිවිය හැක.

රෝගී පැලවල කඳෙහි පාමුල ප්‍රදේශය කුණුවී පැල ඇදවැටී හෝ මැලවී පසුව මැරී යයි.

පාලනය

තවාන් පසේ රෝග ඇති කරන දිලීර වර්ග ඇති බැවින් තවාන් සකස්කරන විට තවාන් පාත්තිවල පස පුළුස්සා ගන්න

එසේ නොමැති නම් පහත සඳහන් දිලීරනාශක වලින් එකක් දියකර පස හොඳින් තෙමෙන සේ මල් බාල්දියකින් පසට යොදන්න.

| | | |
|---|---|---|
| කැප්ටාන් 50% | - | ග්‍රෑම් 6 |
| කැප්ටාන් 80% | - | ග්‍රෑම් 4 |
| ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) | - | ග්‍රෑම් 6 |
| තිරාම් | - | ග්‍රෑම් 7 |
| තයොෆනේට් මීතයිල් (ටොප්සීන්) | - | ග්‍රෑම් 3 |

ඉහත දිලීරනාශක ප්‍රමාණ ජලය ලීටර 5 ක දියකර වර්ග මීටර 2කට යොදන්න. නැතහොත් පහත සඳහන් දිලීරනාශක සමග මිශ්‍ර කර බීජ සිටුවන්න.

| | | |
|---|---|---|
| කැප්ටාන් 50% | - | ග්‍රෑම් 6 |
| කැප්ටාන් 80% | - | ග්‍රෑම් 4 |
| තිරාම් | - | ග්‍රෑම් 4 |

ඉහත ප්‍රමාණය බීජ කිලෝ 1 කට සෑහේ.

### දිලීර මැලවීම

දිලීර වර්ග කිහිපයක් නිසා ඇති වේ.

රෝග ලක්ෂණ

ගස මැලවී යයි. ගසේ පාමුල හා මුල් කුණුවී යයි. සමහරවිට මුල් හා පාමුල කොටසේ සුදුපාට දිලීර දැකිය හැක.

පාලනය

කාණු ගැඹුරු කර හොඳින් ජලය බැස යාමට සලස්වන්න. ඉහත දිලීරනාශක රෝගී පැලයේ මුල් හා ඒ අවට ඇති පැලවල මුල් හොඳින් තෙමෙන සේ මල් බාල්දියකින් යොදන්න.

## බැක්ටීරියා හිටුමැරීම

පසේ ඇති බැක්ටීරියාවක් මගින් ඇති වේ.

රෝග ලක්ෂණ

පැල මැලවීම සිදු වේ. ගසේ පාමුල හෝ මුල් කුණුවීමක් පිටතින් දක්නට නොලැබේ. පස මට්ටමට අඟලක් පමන උඩින් කඳ කපා පිරිසිදු වතුර භාජනයකට දැමූවිට කිරිපාට නූල් මෙන් බැක්ටීරියා පිටතට පැමිනේ නම් මෙය බැක්ටීරියා හිටුමැරීම බව ස්ථිරවම නිගමනය කල හැක. මේ අනුව දිලීර හිටුමැරීමෙන් මෙය වෙන් කර හඳුනාගත හැකිය.

පාලනය

කාණු ගැඹුරු කර හොඳින් ජලවහනය ඇති කරන්න.

ප්‍රතිරෝධී වර්ග වගා කරන්න. KWR ඉතාමත් ප්‍රතිරෝධීය. T-146, තරමක් මෙයට ප්‍රතිරෝධීවේ.

පසට කාබනික පොහොර යොදන්න.

## අංගමාරය

රෝග ලක්ෂණ

කොළවල හා කදේ දුඹුරු හෝ කළුපාට පුල්ලි ඇති වේ. ඒවා වැසි හෝ මීදුම සහිත කාලගුණයේදී ඉක්මණින් විශාල වී කුණුවී යයි. පුල්ලිවලට උඩින් ඇති ගසේ කොටස් කඩාවැටීම හෝ මැලවීම සිදුවේ. මෙම පුල්ලි ගසේ ඕනෑම තැනක ඇතිවිය හැක. ගෙඩිවලද එම පුල්ලි ඇතිවී ගෙඩිද කුණුවී යයි.

පාලනය

වැසි සහිත කාලගුණයක් ඇතිවිටදී රෝගය ඉක්මනින් පැතිරී ගස් සියල්ලම විනාශ වී යා හැකි බැවින් රෝග ලක්ෂණ දුටුවහාම පහත දිලීරනාශක වලින් දෙකක් තෝරාගෙන මාරුවෙන් මාරුවට සති 2 කට වරක් යොදන්න.

| | |
|---|---|
| ක්ලෝරෝතැලොනිල් (ඩැකොනිල්) | - මි.ලී. 30 |
| ප්‍රෙපිනෙබ් (ඇන්ට්‍රකෝල්) | - මි.ලී. 20 |
| මැන්කොසෙබ් | - මි.ලී. 20 |
| මැනෙබ් | - මි.ලී. 25 |
| ප්‍රොපමොකාබ් (ප්‍රෙවිකර්) | - මි.ලී. 35 |

ඉහත දිලීර නාශක ප්‍රමාණය ජලය ලීටර 10 ක දියකර ගස් හොඳින් තෙමෙන සේ යොදන්න.

නිර්දේශිත ආකාරයට පොහොර මිශ්‍රණ යොදන්න. වැඩියෙන් යූරියා පොහාර නොයොදන්න.

රෝගි ගස් හා ගෙඩි ක්ෂේත්‍රයෙන් ඉවත්කර විනාශ කර දමන්න.

## පිටිපුස් රෝගය

රෝග ලක්ෂණ

සුදුපාට පිටි වැනි දිලීරයේ කොටස් කොලවල යටි පැත්තේ මුලින්ම ඇති වේ. මේ නිසා කොළවල උඩ පැත්ත කහපාට වේ.

පාලනය

රෝග ලක්ෂණ දුටු වහාම සල්ෆර් කුඩු ග්‍රෑම් 50 ජලය ලීටර 10 ක දියකර ඉසින්න. අවශ්‍ය නම් නැවත සතියකින් ඉසින්න.

## ඇන්ත්‍රැක්නෝස් රෝගය

රෝග ලක්ෂණ

ගෙඩි කුණුවීම හා කඳ ඉහළ සිට කුණුවීම, මල් හැලීයාම සිදු වේ. වැසි සහිත කාලගුණයේදී රෝගය දරුණු වේ.

පාලනය

පහත සඳහන් දිලීරනාශක වලින් එකක් යොදන්න.

| | |
|---|---|
| ක්ලෝතැලොනිල් (ඩැකොනිල්) | - ග්‍රෑම් 20 |
| මැන්කොසෙබ් | - ග්‍රෑම් 20 |
| මැනෙබ් | - ග්‍රෑම් 20 |
| කාබන්ඩසිම් (බැවිස්ටින්) | - ග්‍රෑම් 7 |

ඉහත දිලීර නාශක ප්‍රමාණ ජලය ලීටර 10 ක දියකර ඉසින්න.

## ගෙඩිවල යට කුණුවීම

මෙය බෝගයකට ලැබෙන ජල ප්‍රමාණය වැඩිවීම හෝ අඩුවීම නිසා ඇතිවන්නකි.

රෝග ලක්ෂණ

ගෙඩියේ යටි පැත්ත කුණුවී යයි.

පාලනය

වතුර වැඩි කාලවලදී කාණු ගැඹුරු කර වතුර බැස යාමට සලස්වන්න.

වතුර හිඟ කාලවලදී වතුර සපයන්න.

තෙතමනය ඒකාකාරීව පවත්වා ගැනීමට පිදුරු, කොළ වගී ආදිය යොදා පැල අවට වසුන් කරන්න.

## වෛරස් රෝග

ලංකාවේ තක්කාලි වගාවට බලපාන වෛරස් රෝග කිහිපයකි.

පිපිඤ්ඤා විචිත්‍ර වෛරසය (CMV)

දුම්කොළ විචිත්‍ර වෛරසය (TMV)

ටොමැටෝ ස්පොටඩ් විල්ට් වෛරසය (TSWV)

තක්කාලි කහපැහැ කොළ කොඩවීමේ වෛරසය (TYLCV)

කර්ලි ටොප් වෛරසය (CT)

### CWV **රෝග ලක්ෂණ**

ශාක කුරුවීම, පත්‍ර කහවීම,පත්‍ර සිහින්වීම ගෙඩි කුඩාවීම, අඩුවීම හා ප්‍රමාද වී මේරීම

බෝවීම

කුඩිත්තන් මගින්, රෝගී ශාක වල යුෂ නිරෝගී ශාකවල තැවරීමෙන්, වල් පැලෑටි බීජ මගින්

පාලනය

වල් පැලෑටි විනාශ කිරීම.

පිපිඤ්ඤා කුලයේ හා සොලනේසී කුලයේ බෝග සමඟ තක්කාලි මිශ්‍ර වගාවක් ලෙස වගා නොකිරීම.

රෝගී පැල ඉවත් කිරීම.

රෝග වාහකයාගේ ගහනය අඩුකර ගැනීමට නිර්දේශිත කෘමිනාශක යෙදීම.

### TMV **රෝග ලක්ෂණ**

ශාක කුරුවීම

පත්‍ර, මීවන පත්‍ර මෙන් සිහින්ව දික්වීම.

පත්‍ර විචිත්‍රය හා පත්‍ර රැලි ගැසීම.

ගෙඩි ඉදීම ඒකාකාරව සිදුනොවීම

බෝවීම

රෝගී ශාකවලින් ලබාගත් බීජ මගින්

රෝගී වගාවන්හි පස් හා මුල් මගින්

රෝගී ශාක කොටස් වලින්

පාලනය

ආසාදිත ශාක පුළුස්සා දැමීම, පිරිසිදු බීජ භාවිතය, බීජ ප්‍රතිකාරක යෙදීම, ට්‍රයිසෝඩියම් ඩිකෝ පොස්පේට් ද්‍රාවණයේ විනාඩි 15 ක් බීජ තබා ජලයෙන් සෝදා බීජ වේලීම.

### TSWS **රෝග ලක්ෂණ**

පත්‍රවල තඹ පැහැයක් ඇති වේ.

ලපටි පත්‍ර මත තද පැල්ලම් හටගනී.

අග්‍රස්ථය මියයාම හා ශාක කඳ මත ඉරි ඇතිවේ.

අතු මැලවී කඩා වැටේ. ගෙඩි මත රවුම් පැල්ලම් ඇති වේ.

බෝවීම

පැල මැක්කන් මගින්, බීජ මගින්, ශාක යුෂ මගින්.

පාලනය

වල් පැලෑටි විනාශ කිරීම, රෝගී පැල ඉවත් කිරීම, නිරෝගී බීජ භාවිතය, වාහකයාගේ ගහණය අඩුකිරීම, නිර්දේශිත කෘමිනාශක යෙදීම.

### TYLCV **රෝග ලක්ෂණ**

කඳෙහි අග්‍රස්ථ ඍජුව තිබීම හා පසුව කෙටිවීම.

පත්‍ර කුඩාවීම.

පත්‍ර උඩට හෝ යටට හැකිලීම.

වර්ධනය බාලවීම.

බෝවීම

සුදුමැස්සා මගින් බෝවේ. නමුත්, බීජ හා ශාක යුෂ මගින් මෙම රෝගය බෝ නොවේ.

පාලනය

සුදුමැස්සා පාලනයට නිර්දේශිත කෘමිනාශක යෙදීම. රෝගීශාක ඉවත්කිරීම, වල්පැලෑටි විනාශ කිරීම.

CT **රෝග ලක්ෂණ**

කුඩා කළ රෝග ශාක වියළී මිය යයි, ශාක කුරු වේ, පත්‍ර නටු පහතට කඩා වැටේ, පත උඩ අතට හැකිලේ, පත්‍ර දුඹුරු පැහැවී නාරටි දම් පැහැවේ. ගෙඩි මත දුඹුරු පැහැති පැල්ලම් හටගනී.

බෝවීම

කොළපාට කීඩෑවන් මගින් බෝවන මෙම රෝගය ශාක යුෂ මගින් ව්‍යාප්ත නොවේ.

පාලනය

වල්පැලෑටි පාලනය, නිර්දේශිත කෘමිනාශක යොදා වාහකයා පාලනය. රෝගී ශාක ඉවත් කිරීම, බීට් හා තක්කාලි මිශ්‍ර බෝග ලෙස වගා නොකිරීම.

## අස්වනු නෙලීම

ගෙඩි කොළ පැහැයේ සිට කහ පැයට හැරෙන අවස්ථාවේදී නෙලාගන්න. අස්වනු නෙලීම 10- 12 වරකට පමණ කළ යුතුය.

## අස්වැන්න

හොඳින් නඩත්තු කළ වගාවකින් හෙක්ටයාරයකට ටොන් 20-30 පමණ අස්වැන්නක් ලබාගත හැකිය.

## අස්වැන්න සකසා ගැනීම

නෙලාගත් ගෙඩි, ප්‍රමාණය අනුව වර්ග කර, හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි ලී පෙට්ටිවල අසුරා වෙළඳපොලට යවන්න.